මානව විවිධත්වය පිළිබඳ ආගමික දෘෂ්ටිකෝණය

Dr. A. Kaluarachchi

Abstract

In the study of human history, religion is one of the most intimate experiences of man. The close relationship between man and religion is clearly evident in the study of human history. There are many world religions that have been around since ancient times. All those religions can be identified as theistic and atheistic by a prominent characteristic. The definitions and interpretations presented with respect to the man by those religions are common. Among them, special attention has been paid to the physical and mental existence of man and the diversity created in individual activities has been analyzed from a God-centric perspective. It appears that not all religions look at the diversity that is evident in man in the same way. Accordingly, it is expected in this article to examine the nature of various interpretations about the individual from the world's leading religious sources. For the primitive man, the diversity and splendor of the universe as well as its constant changes caused surprise, amazement, curiosity and anxiety. Those characteristics were able to create fear and devotion in man. It can be clearly identified in the study of historical facts that religions emerged as a result of man's devotion to nature. A complexity of ideas on the individual and the world have logically been developed with the religious ideologies. According to the central teachings of each religion, the ideas on the origin, evolution, diversity, existence after death and final goal etc. of the individual have been revealed. Further, according to those religious beliefs, among the ideologies presented on the individual, one part of the person was created by some non-evolving universal substance. Deists believe supernatural energy of God. Another group asserted that everything, including the individual, has its origin without God. It is clear from the sources that religions other than Buddhism are built on a theistic basis. Another group of individuals have tried to explain the origin and diversity of the individual in terms of physical factors. They are called materialists. However, it is clear that man has been analyzed through different approaches from different religious traditions.

Keywords : religion, human diversity, ideologies, religion, theism

සාරාංශය

මානව ඉතිහාසය අධ්‍යයනයේ දී ආගම යනු මිනිසාගේ සමීපත ම අත්දැකීමකි. ආගම සහ මිනිසා අතර පවත්නා අවිච්ඡින්න සම්බන්ධතාව විවිධ සාධක සමග බැඳී පවත්නා අයුරු මානව ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී මැනවින් පැහැදිලි වේ. දුරාතීතයේ සිට පැවත එන ලෝක ආගම් බොහෝ ප්‍රමාණයකි. ඒ සියලුම ආගම් දේවවාදී සහ අදේවවාදී වශයෙන් ප්‍රමුඛ ලක්‍ෂණද්වයකින් හඳුනා ගත හැකිය. එකී ආගම්වලින් මිනිසා පිළිබඳ ඉදිරිපත් වී ඇති නිර්වචන හා විග්‍රහයන් සුලබ වේ. ඒ අතර මිනිසාගේ කායික සහ මානසික පැවැත්ම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කොට තිබීමත් පුද්ගල ක්‍රියාකාරීත්වයේ දී නිර්මාණය වන විවිධත්වය දේව කේන්ද්‍රීයව විග්‍රහ වී තිබීමත් විශේෂතාවක් වශයෙන් දැක්විය හැකිය. සෑම ආගමක් ම මිනිසා තුළ ප්‍රකට වන එම විවිධතාවන් දෙස එකම ආකාරයකින් බලා නොමැති බව පෙනී යයි. ඒ අනුව ලොව ප්‍රමුඛ ආගමික මූලාශ්‍රයවලින් පුද්ගලයා පිළිබඳ ඉදිරිපත් වී ඇති විවිධාකාරයේ විවරණවල ස්වභාවය විමසා බැලීම මෙම ලිපියෙන් අපේක්ෂිතය. ප්‍රාථමික මිනිසාට විශ්වයෙහි විවිධත්වය හා විචිත්‍රත්වය මෙන්ම එහි නිරන්තරයෙන් සිදුවන විවිධාකාර විපර්යාස ආදිය පුදුමය, විස්මය, කුතුහලය මෙන්ම කනස්සල්ල ද ගෙන දෙන්නක් විය. එකී ලක්‍ෂණ මිනිසා තුළ භයපක්‍ෂපාතීත්වය හා භක්තිය ඇති කිරීමට සමත් විය. මිනිසා ස්වභාව ධර්මයා කෙරෙහි භක්තිය මත පදනම්ව කටයුතු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ආගම් බිහි වූ බව ඓතිහාසික කරුණු අධ්‍යයනයේදී පැහැදිලිව හඳුනාගත හැකිය. ආගමික මතවාද තර්කානුකූලව වර්ධනය විමත් සමගම පුද්ගලයා සහ ලෝකය පිළිබඳ අදහස්වල සංකීර්ණත්වයක් ගොඩනැගුණි. ඒ ඒ ආගම්වල කේන්ද්‍රීය ඉගැන්වීම්වලට අනුව පුද්ගලයාගේ ප්‍රභවය, පරිණාමය, විවිධත්වය, මරණින් මතු පැවැත්ම සහ නිෂ්ටාව ආදිය පිළිබද අදහස් ප්‍රකට වී ඇත. එම ආගමික විශ්වාසයන්ට අනුව පුද්ගලයා පිළිබද ඉදිරිපත් කරන ලද මතවාද අතර කිසියම් අවිපරිණාමී විශ්වීය පදාර්ථයක් විසින් පුද්ගලයා නිර්මාණය කරන ලද බව එක් කොටසක් විසින් කරනු ලැබිණි. එම ඓහලෞකික ශක්තිය දෙවියන් බව දේවවාදීහු සැලකූහ. තවත් පිරිසක් පුද්ගලයා ඇතුළු සියල්ල ඊශ්වරත්වයකින් තොරව ප්‍රභවය වී පවතින බව ප්‍රකාශ කළහ. බුදු දහම හැර අනෙකුත් ආගම් දේවවාදි පදනමක් මත ගොඩනැගී ඇති බව තදනුබද්ධ මූලාශ්‍රය අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වේ. භෞතික සාධක අනුව පුද්ගලයාගේ ප්‍රභවය සහ විවිධත්වය විවරණය කිරීමට තවත් පිරිසක් උත්සාහ කොට ඇත. භෞතිකවාදීන් ලෙස හැඳින්වෙන්නේ ඔවුන්ය. කෙසේ වෙතත් විවිධ වූ ආගමික සම්ප්‍රදායයන්ගෙන් මිනිසා එකිනෙකට වෙනස් ප්‍රවේශයන් ඔස්සේ විග්‍රහයට බඳුන් වී ඇති බව පැහැදිලිය.

ප්‍රමුඛ පද : ආගම, දේවවාදී, මතවාද, මානව විවිධත්වය

JOURNAL OF THE FACULTY OF HUMANITIES 31

1. හැඳින්වීම

ප්‍රාග් බෞද්ධ යුගයට අයත් වේදය ලෝක සාහිත්‍යයෙහි විශිෂ්ඨත ම අංගයක් ලෙස විද්වතුන්ගේ පිළිගැනීමට ලක්ව ඇත. එහි දී මේ සම්බන්ධයෙන් විවිධ අදහස් ඉදිරිපත් වී ඇත. වේද සාහිත්‍යයට අනුව ලෝකය පාලනය කරන කිසියම් බාහිර බලවේගයක් පිළිබඳ අදහස ඊශ්වර නිර්මාණවාදයක් හෙවත් ඒක දේවවාදයක් දක්වා විකාශය වූයේ මිනිසා තුළ පැවති ස්වාභාවික වස්තූන් පිළිබඳ දෘඪ විශ්වාසය, බිය හා භක්තියයි. ඊශ්වර නියතිවාදයට අනුව සියල්ල සිදුවන්නේ මැවුම්කාර දෙවියාගේ ඕනෑ එපාකම් හෙවත් නියමය අනුව ය. සියල්ල සිදුවිය යුතු ආකාරය ඔහු විසින් නියම කරන ලදි. ඔහු සර්වඥ වෙයි. සර්වබලධාරී වෙයි. සර්වඥ නිසා කාලත්‍රයවර්ති සියල්ල දනී. ඒ නිසා ඔහුට ඉහළින් කිසිවකු නැත. ඔහුගේ නියමය කිසිවකුට හෝ වෙනස් කළ නො හැකිය. එය වෙනස් කිරීමට යාම නිෂ්ඵලය. ලොව විවිධ හා විෂම වීමෙහි එකම හේතුව දෙවියන් මැවූ අන්දමයි.[53] මිනිසාගේ ස්වභාවයත්, ඔහුගේ විවිධත්වයත් තීරණය වන්නේ එම දෙවියන්ගේ කැමැත්ත මතය. වේද සාහිත්‍යයෙහි බාහිර ලෝකය පිළිබඳ සත්‍යයත් පුද්ගලයා පිළිබඳ වූ සත්‍යයත් අතර පවත්නා අවියෝජනීය සම්බන්ධතාව දේවවාදී ස්ථාවරයක් මගින් ඉදිරිපත් කිරීමට ප්‍රයත්න දරා ඇත. සමස්ත ලෝකය ම දැවැන්ත පුරුෂයෙකුට උපමා කරමින් එම පුරුෂයාගේ අවයවවලට මිනිසාගේ අවයව ආදේශ කොට ඇත.''පුරුෂයාගේ සිතින් චන්ද්‍රයා බිහි විය. ඔහුගේ ඇසින් සූර්යයා ද, මුඛයෙන් ඉන්ද්‍ර සහ අග්නි දෙවියන් ද හුස්මෙන් වායුව ද ජනිත විය. ඔහුගේ නාභියෙන් අන්තරීක්ෂය ද, පාදවලින් මහ පොළොව ද, කනින් දිසාව ද ඇති විය.''[54] මෙලෙස පුද්ගලයාට ආධාරවන ලෝකය දෙවියන් විසින් නිපදවන ලද්දක් බව එහි කියවේ. මේ අනුව ලොව නිර්මාණය කරන ලද මහා පුරුෂයාගේ ස්වභාවය පුද්ගලත්වාරෝපණයෙන් දක්වා තිබේ. පුද්ගලයාගේ බාහිර හා ආභ්‍යන්තරික අංගෝපාංග එම මහා පුරුෂයාට උපමා කිරීමෙන් පුද්ගලයාට වඩා උසස් තත්ත්වයකට ඔසවා තැබීමක් සිදුකොට ඇත. මෙම අදහස කිසියම් ආකාරයක සංකීර්ණ දෘඪ මතවාදයක් දක්වා ව්‍යාප්තියට පත් වන්නේ මානව චින්තනයේ අවිච්ඡින්න ගලායාමක් වශයෙනි. ඓතිහාසිකව පැවත එන ආගමික මතවාදයන් හමුවේ මිනිසාගේ පැවැත්ම කෙසේ විග්‍රහ වී ඇත්දැයි විමසීම මෙම පර්යේෂණයෙන් අපේක්ෂා කෙරේ. එයට අදාළ දත්ත සපයා ගැනීම සඳහා ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය පරිහරණය කරන අතර සපයා ගනු ලබන දත්ත පර්යේෂණ අරමුණු විග්‍රහ කිරීම විෂයෙහි ගුණාත්මක හා ප්‍රමාණාත්මක අයුරින් භාවිත කිරීමක් අපේක්ෂා කෙරේ. පර්යේෂණයේ අවසන් භාගයේදී මිනිසා හා ආගම අතර පවත්නා අන්තර් සම්බන්ධතාව පිළිබඳ නිගමනයකට එළඹීම අපේක්ෂිතය.

2. සාකච්ඡාව හා ප්‍රතිඵල

මිනිසා පැහැදිලිව ම මහා බ්‍රහ්මයාගේ විවිධ අංගෝපාංග වලින් උපත ලද බව ඍග්වේදයෙහි දැක්වේ.

---

53 ඤාණසුමන හිමි, දෙල්දූවේ., (2009). *ආදී බෞද්ධ දර්ශනයේ මූලධර්ම.* ගොඩගේ සහ සහෝදරයෝ. කොළඹ 10. 38 පිටුව.

54 ඍග්වේදය - 8:9

මහාබ්‍රහ්මයාගේ මුවින් බමුණෝ ද බාහුවෙන් ක්‍ෂත්‍රියෝ ද කලවාවලින් වෛශ්‍යයෝ ද දෙපාවලින් ශුද්‍රයෝ ද උපන්හ.[55]

ඒ අනුව මිනිසා තුළ අන්‍යෝන්‍ය වශයෙන් විවිධත්වයන් ප්‍රකට වීම මහාබ්‍රහ්මයාගේ නිර්මාණ කාර්යය අනුව ම තීරණය විය. ප්‍රාග් බෞද්ධ යුගයේ භාරතීය සාමාජයෙහි බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර වශයෙන් වර්ණමය විවිධත්වයත්, ස්වධර්ම[56] වශයෙන් හඳුන්වන ඒ ඒ කුලවලට අදාළ කාර්යයන් පිළිබඳ (වෘත්තීය) විවිධත්වයත් බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වානප්‍රස්ථ සහ සන්‍යාසි වශයෙන් පැවති පුද්ගල ජීවිතයේ කාල සීමා විවිධත්ත්වයත් අදෘශ්‍යමාන මහාබ්‍රහ්ම නියමයේ දෘශ්‍යමානත්වයයි. මූර්ති මහතා මෙම සමාජයීය විවිධත්ත්වය පූජක, සංග්‍රාමික, ග්‍රාමික හා දාස යනුවෙන් හඳුන්වා දෙයි.[57] බ්‍රාහ්මණ ඉගැන්වීමට අනුව සාමාන්‍ය පුද්ගලයාගේ සියලු විවිධතාවන්හි කේන්ද්‍රීය විභව ශක්තිය වන්නේ යාගයයි. එම යාගයේ අයිතිකරුවා මහා බ්‍රහ්මයා. ඊශ්වර නිර්මාණවාදයට අනුව බාහිර හා අභ්‍යන්තර වශයෙන් විද්‍යමාන වන පුද්ගල වෛමත්තතාවට ප්‍රමුඛත ම සාධකය මහාබ්‍රහ්ම නම් විශ්ව පදාර්ථයයි.

පුද්ගල විවිධත්වය හෙවත් වෛමත්තතාව (difference) පිළිබඳ නිර්මාණවාදී අදහස් ඉක්මවා ගිය දාර්ශනික අදහස් ද වේද සාහිත්‍යයෙහි අන්තර්ගත වේ. අඝමර්ෂණ යනු සාම්ප්‍රදායික චින්තනයෙන් මිදී පරිණාමීය ස්වභාවවාදී දෘෂ්ටියකින් සත්ත්වයා හා ලෝකය දෙස විමර්ෂණාක්ෂිය යොමු කළ චින්තකයෙකි. අඝමර්ෂණගේ කාලවාදයට අනුව පුද්ගලයාගේ ප්‍රභවයට *තමස්* නමින් හඳුන්වන උෂ්ණධර්මය මූල හේතුව වූ බව පෙනේ. "ඉන්පසු අන්ධකාරය ද, (තමස්) තදනන්තරව ජලය ද, ජලයෙන් සංවත්සර හෙවත් කාලය ද බිහි විය. ඉරහඳ, දිව්‍යලෝක, පෘථිවිය, ආකාශ, ආලෝකය, දිවා රෑ බිහි වීම සඳහා එකී සංවත්සර හෙවත් කාලය හේතු විය. කාලයාගේ ඇවෑමෙන් ලෝකයේ සියලු පාරිසරික කාරණාවන් සිද්ධ විය".[58] මේ අනුව පුද්ගල ජීවිතයෙත් මරණයේත් භාරකරුවා කාලය බව අඝමර්ෂණ පෙන්වා දෙයි. ඔහුගේ අදහසට අනුව පුද්ගලයා බිහි වූයේ ස්වභාවවාදී හෝ සනාතන නියාම ධර්මයක් මත පදනම්වය.

සංශයවාදී දෘෂ්ටියකින් පුද්ගලයා විවරණය කළ වෛදයික චින්තකයෙකු ලෙස ප්‍රජාපතී පරමේෂ්ඨින් හැඳින්විය හැකිය. ඔහු අඝමර්ෂණට පසුව බිහි වූ වෛදික චින්තකයෙකු ලෙස සැලකේ. ප්‍රජාපතීගේ අදහසට අනුව පුද්ගලයා හා ලෝකය බිහි වීමේ මූල කාරණය ජලය වන අතර එය පරිණාමය වීමේදී උපන් ඒකකය පිළිබඳ අදහස ද පුද්ගල විවිධත්වය විෂයෙහි වැදගත් තැනක් කොට සැලකිය හැකිය. ඔහුගේ අදහස නාසදීය සූත්‍රයෙහි මෙසේ විවරණය වී තිබේ. "එකල සත් පදාර්ථයක් හෝ අසත් පදාර්ථයක් නො වීය. පොළොව හෝ අහස නො වීය. එහි කුමක් පැවතියේ ද කාගේ රැකවරණයක් වී ද අගාධ වූ ගම්භීර වූ ජලය වී ද"[59] යනුවෙන් ඔහු සිය අදහස සංශයවාදීව ඉදිරිපත් කරයි. ප්‍රජාපතී තපස් හෙවත් උණුසුම මත ජලය පරිණාමය වූ බව ප්‍රකාශ කරයි.

---

[55] බ්‍රාහ්මනෝශ්‍ය මුඛමාසීද් - බාහු රාජන්‍යඃ කෘතඃ
ඌරුතදශ්‍ය යද් වෛශ්‍යාම් - පද්භ්‍යාම් ශුද්‍රෝ අජායත, ඍග්වේදය 10-90, පුරුෂ සූක්තය.

[56] මනුෂ්මෘතිය, 1:88, 90 - 91 පිටු

[57] මූර්ති., (2009). *ආගම සහ මිය ගිය ලෝකය.* මයුර ප්‍රකාශකයෝ. 106 පිටුව.

[58] ඍග්වේදය, 10-90

[59] නෝසදාසීත් නාසදාසීත් තදානීම් - නාසිද්‍රජෝ නෝ ව්‍යෝම පරෝයත්
කිමාරීවඃ කුහකශ්‍ය ශර්මන් - අම්බඃ කිමාසීත් ගගණං ගභීරම්, ඍග්වේදය, 10, නාසදීය සූක්තය

මෙසේ ඇති වන්නා වූ පරිණාමයේ දී උණුසුමින් ඇතිවන වැදගත් ම මූල ධර්මය නම් කාම හෙවත් චේතනාවය.[60] එම කාමය හෙවත් චේතනා බලය මනස හෝ ආත්මයට හේතුවන එකම බලය යි. පුද්ගලයාගේ ප්‍රභවය පිළිබඳ අදහසක් මෙම අවස්ථාවෙන් ඉස්මතු වේ. එහි දී බිහි වන මනස සාමාන්‍ය මිනිසුන්ගේ මනස හා සමාන නො වේ. එය ලෝකය පාලනය කරන්නා වූ සූර්යයා ය. එම නිසා සූර්යයාට පසුව ලෝකයෙහි දෙවි මිනිසුන් ආදී සියලු දේ බිහි විය. මෙසේ බිහි වූ පුද්ගලයන් අතර විවිධතාවන් උණුසුම නමැති ඒකකය හේතු වූ බව ඔහුගේ ප්‍රකාශයෙන් පෙනේ. ඉහත චින්තකයින් දෙදෙනාගේ අදහස්වලින් පුද්ගලයා සහ විවිධත්වය ගැන දාර්ශනික පැතිකඩක් විද්‍යමාන වේ.

පශ්චාත්කාලීන උපනිෂද් මත ඉහත ආකාරයේ දාර්ශනික අදහස් ප්‍රභවය වීමට හේතු විය. උපනිශද් දර්ශනය තුළ පුද්ගලයා කොටස් දෙකකින් සමන්විත වන බව දක්වයි. එනම් ආත්මය හා ශරීරයයි. "ආත්මය නූපදී. නො මැරේ. එය කිසිවකුනුදු හට නො ගන්නේය. ඉදිරියට කිසිවක් හට ගන්නේ ද නැත. එය සර්වකාලිකය. සිරුර වැනසුණ ද ආත්මය නො වැනසේ."[61]

උපනිශද් අදහස අනුව ආත්මය පුද්ගලයා වශයෙන් සලකා තිබෙන බව පැහැදිලිය. ආත්මය ඇති විට ප්‍රාණය ක්‍රියාවන් කිරීමට පොහොසත් වේ.[62] මෙසේ ආත්මය ඇති විට ප්‍රාණය ක්‍රියාත්මක වීමේ දී පුද්ගලයාගේ ක්‍රියාකාරිත්වයෙහි විවිධතාවන් ප්‍රකට වේ. එය වෛමත්තතාවයි. පුද්ගලයාගේ ක්‍රියාකාරිත්වය අනුව ප්‍රධාන ප්‍රභේද දෙකක් වේද සාහිත්‍යයේ සඳහන් වෙයි.[63] එනම් යහපත්, හොඳ සහ පාපී පුද්ගලයන්ය. සාධුචර්යාවන්, පුණ්‍ය ක්‍රියාවන්හි නියැලෙන්නා යහපත් පුද්ගලයා ලෙසත් අසත් චර්යාවන්හි යෙදෙන්නා පාපි පුද්ගලයා ලෙසත් දක්වා තිබේ.

ක්‍රි:පූ 06 වන සියවසේ කරලියට පැමිණ තිබූ ෂට් ශාස්තෲවරුන්ගේ ඉගැන්වීම්වල විද්‍යමාන පුද්ගල විවිධත්වය පිළිබඳ විමසීමේ දී විවිධ අදහස් ඒවායෙහි අන්තර්ගත වී ඇති ආකාරය දැක ගත හැකිය. පුද්ගල විවිධත්වය ප්‍රකට වන එක් අංශයක් වන්නේ පුද්ගල ක්‍රියාකාරීත්වයයි. එම ක්‍රියාවන්ට සාපේක්ෂව මානසික විවිධත්වය ද පැහැදිලි වේ. එහෙත් අකිරියවාදි ශාස්තෲවරයකු වූ පූර්ණ කස්සප පව් කිරීම හෝ අනුන් ලවා කරවීම, දඬුමුගුරුවලින් අනුන්ට පීඩා කිරීම, හොරකම් කිරීම, මංකොල්ල කෑම, අනුන්ගේ අත් පා ආදිය සිඳීම, අනුන් පෙළීම, වෙහෙසට පත් කිරීම, කම්පාවට පත් කිරීම, පරදාර සේවනය, වචනයෙහි විශ්වාසය කඩකිරීම, කරවීම ආදිය පාප ක්‍රියාවන් නොවන බව පවසයි. එපමණක් නොව යමෙක් චක්‍රායුධයකින් මේ පෘථිවියේ ප්‍රාණීන් මරා එකම මස් ගොඩක් කළ ද ඒ හේතුවෙන් පාපයක් සිදු නො වේ.

JOURNAL OF THE FACULTY OF HUMANITIES-31

---

60 තපස්තන්මහිතා ජායතෛකම් -එම

61 න ජායතේ ම්‍රීයතේ වා විපශ්චිත්- නායං කුතශ්චින්න බභූව කශ්චිත්
අජෝ නිත්‍යඃ ශාස්වතෝයං පුරාණෝ- න හන්‍යතේ හන්‍යමානේ ශරීරේ,
කඨෝපනිෂදය- 18

62 තස්මින්නපො මාතරිශ්වා දධාති -එම

63 යථාකාරී යථාචාරී තථා භවති. සාධුකාරී සාධු භවති. පාපකාරී පාපො භවති -බෘහ.උප, 4 ,5

දානයෙන්, දමනයෙන්, සංයමයෙන්, සත්‍ය වචනයෙන් යුතුව සිටිය ද එමගින් ද කිසිදු පිනක් සිදු නො වේ යැයි පවසයි. ඒ අනුව පුද්ගල ක්‍රියාකාරීත්වයෙන් ප්‍රකට වන විවිධත්වය ඔහු නො පිළිගනී.[64] මහාචාර්ය බරුවා මහතා ප්‍රකාශ කරන්නේ ඔහු නිෂ්ක්‍රීය ආත්මයක් පිළිබඳ මතයක් දරන්නෙකු බවයි. නිෂ්ක්‍රීය යන්නෙහි අදහස පුද්ගලයාට හොඳ හෝ නරක කිසිදු ක්‍රියාවක යෙදිය නො හැකි බවයි.[65]

මක්ඛලීගෝසාල ශාස්තෘවරයා ඉදිරිපත් කළේ අහේතු අප්පච්චවාදයකි. එනම් හේතුඵල සම්බන්ධතාවකින් තොරව සියල්ල අහේතුකව, ආකස්මිකව, ඉබේම සිදුවන බවයි. සත්වයන්ගේ කෙලෙසීමට හේතුවක් නැත. පුද්ගල වේමත්තාව විෂයෙහි ද හේතුවක් නැතිව ප්‍රත්‍යයක් නැතිව ඉබේම සත්වයෝ කෙලෙසෙති. සත්වයන්ගේ පිරිසිදු වීමට ද හේතුවක් නැත. ප්‍රත්‍යයක් නැත. හේතුවක් නැතිව ප්‍රත්‍යයක් නැතිව සත්ත්වයෝ පිරිසිදු වෙති[66]. පුද්ගලයාට වීර්ය ක්‍රියා, පුරුෂ ශක්තිය, පුරුෂ පරාක්‍රමය කියා දෙයක් නොමැත.[67] එසේම උපතේ සිට මරණය දක්වාත් මරණයේ සිට විමුක්තිය දක්වාත් ජීවිතය කිසියම් නිශ්චිත රටාවකට. නියමයකට හෙවත් කලින් සම්මත වූ ක්‍රමයකට අනුව සිදු වේ යැයි ඔහු වැඩි දුරටත් පවසයි. ඒ අනුව පුද්ගල වේමත්තතාව පිළිබඳ මක්ඛලී ගෝසාලගේ දර්ශනය අහේතු අප්පච්චවාදයක්, නියතිවාදයක් ලෙස හඳුනා ගත හැකිය. මොහුගේ ඉගැන්වීම් ජනයාට අනර්ථය පිණිස ම පවතින බැවින් බුදුරජාණන් වහන්සේ ඒවා එකහෙලා ම ප්‍රතික්ෂේප කළහ.[68]

ජෛන දර්ශනය ද ක්‍රි:පූ: 6 වන සියවසෙහි ඉතා ප්‍රසිද්ධියට පත් ආගමික සම්ප්‍රදායක් විය. ජෛනාගම බහු ශාස්තෘයික ආගමකි. ඒ අතරින් නිගණ්ඨ නාථපුත්තට විශේෂ ස්ථානයක් හිමි වේ. ජෛනයින් ස්වේතාම්බර හා දිගම්බර වශයෙන් දෙ කොටසකි.[69] නිගණ්ඨනාථපුත්ත ෂට් ශාස්තෘන් අතර කිරියවාදයක් ප්‍රකාශ කළ එක ම ශාස්තෘවරයා ය. ජෛන දහමට අනුව විශ්වය කිසියම් කෙනකු විසින් නිර්මාණය කරන ලද්දක් හෝ මවන ලද්දක් හෝ නොව සදාකාලිකව පවතින්නකි. මේ විශ්වයේ ඇති සෑම දෙයක් ම ජීව-අජීව වශයෙන් කොටස් දෙකකට බෙදේ.[70] ජීව යනු ආත්ම වශයෙන් හඳුන්වන තත්ත්වයයි. පුද්ගලයාගේ අනෙක් අංශය ශරීරයයි. ශරීරවලට සම්බන්ධ වන ජීව ඒකක කර්මය විසින් පවත්වාගෙන යනු ලැබේ. කර්මය බලපවත්වන තුරු එම ජීව ඒකකයන්ට සසරින් මිදීමක් නැත. ජෛන දර්ශනයෙහි පුද්ගලයා පිළිබඳ අදහස එයයි.

JOURNAL OF THE FACULTY OF HUMANITIES

[64] ''කරොතො බො මහාරාජ කාරයතො ජිඥතො ඡේදාපයතෝ පචතො පචායතො සොචයතො සොචායතෝ කීලමයතො කීලමාපයතො එන්දයතො එන්දාපයතො පාණමනිපාතයතො අදින්නං ආදියතො සන්ධිං ඡන්දතො නිල්ලෝපං හරතො ඒකගාරිකං කරොතො පරිපන්ථ තිට්ඨතො පරදාරං ගච්ඡතො භණතො මුසා භණතො කරොතෝ න කරීයති පාපං''දී.නි I, සාමඤ්ඤඵල සූත්‍රය, 91 පිටුව

[65] නාරද හිමි, දියගම., (2009). *ෂට් ශාස්තෘන් සහ බුදුදහම.* කතෘ ප්‍රකාශන. 58 පිටුව

[66] "නත්ථි මහාරාජ හේතු නත්ථි පච්චයෝ සත්තානං සංකිලෙසාය අහේතු අප්පච්චයා සත්තා සංකිලිස්සන්ති. නත්ථි හේතු නත්ථි පච්චයෝ සත්තානං විසුද්ධියා අහේතු අප්පච්චයා සත්තා විසුජ්ඣන්ති. දී.නි I, සාමඤ්ඤඵල සූත්‍රය, 92 පිටුව.

[67] එම

[68] අං.නි, යෝධාජීව සූත්‍රය, 236 පිටුව.

[69] නාරද හිමි, දියගම., (2009). *ෂට් ශාස්තෘන් සහ බුදුදහම.* කතෘ ප්‍රකාශන. 59 පිටුව.

[70] වීරරත්න, ඩබ්. ජී., (1995). *බුදුදහම හා එහි ආගමික පසුබිම.* ප්‍රදීප ප්‍රකාශකයෝ. කොළඹ 12,97 පිට.

විවිධ මනෝභාවයන් නිසා පුද්ගලයාගේ කායික හා මානසික ක්‍රියාවන්හි ඇති වන විවිධත්වය පිළිබඳ අවධානය යොමු කළ නිගණ්ඨනාථපුත්ත ජීවිතය යහපත් කරගැනීම සඳහා චතුයාම සංවරය,[71] පඤ්ච විරමණය[72] ආදි ආචාර ධර්මාත්මක ඉගැන්වීම් කිහිපයක් ඉදිරිපත් කොට ඇත. එම ඉගැන්වීම්හි කැපී පෙනෙන ගුණාංගයක් වූයේ පරම අවිහිංසාවාදයයි. සිසිල් දියෙන් වැළකීමෙන් නාථපුත්ත අවධාරණය කළේ ජලයෙහි සිටින කුඩා ප්‍රාණීන් පවා විනාශ වන අවස්ථාවන්ගෙන් වැළකිය යුතු බවයි. සියලු සංවරයෙන් යුක්ත වීම යන්නෙන් කාය, වාග්, මනෝ, දණ්ඩ ආදියෙන් සිදුවන වැරදිවලින් වැළකීමත්, නොයෙකුත් ව්‍රත අනුගමනයෙන් සියලු පව් සෝදා හැරීමත් දැනට ඉතිරිව ඇති විවිධ කර්ම ක්‍ෂය කිරීමෙන් මෝක්‍ෂය ලබා ගැනීමත් දක්වා ඇත.

බෞද්ධ පංචශීල ප්‍රතිපදාවට සමානතාවක් දක්වන පඤ්ච විරමණය පුද්ගලයන් තුළ සදාචාරය වර්ධනය කිරීමේ ප්‍රතිපත්තිමය ඉගැන්වීමක් ලෙස ද සැලකිය හැකි ය. ඉහත ඉගැන්ම් තුළින් විසඳුම් ලබා දෙන්නේ සමාජ විරෝධී පුද්ගල විවිධත්වයන් වළක්වා ගැනීම සඳහාය. ප්‍රාණඝාතයේ යෙදෙන්නන්, මුසාබස් තෙපලන්නන්, සොරකම් කරන්නන්, අන්සතු ස්ත්‍රීන් හා පුරුෂයන් සේවනය කරන්නන් ආදී වශයෙන් පුද්ගල විවිධත්වයන් රැසක් ජෛන දහමෙන් විද්‍යමාන වේ. කර්මය පුද්ගල වෛමත්තතාවට ප්‍රබල හේතුවක් බව ජෛන දර්ශනයෙන් අවධාරණය කොට තිබේ.

1. ඤාණාවරණීය කර්ම -නුවණ මුලාකරන කර්මය
2. දර්ශනාවරණීය කර්ම -ආත්මය කිළිටි කරන කර්ම
3. වේදනීය කර්ම -සැපදුක් විඳවන කර්මය
4. මෝහනීය කර්ම -උස්පහත්කම් ඇතිකරන කර්ම
5. ජීවකාලය නියමකරන කර්ම -ආයු කර්ම
6. නාම කර්ම -ශරීරාවයව ඇතිකරන කර්මය
7. ගෝත්‍ර කර්ම -ජාති ගෝත්‍ර බෙදන
8. අන්තර් කර්ම -කරනු ලබන දෑට බාධා කරන කර්මය[73]

ඉහත ජෛන කර්ම සංකල්පයට අනුව පුද්ගලයා තුළ ඇතිවන බොහෝ විවිධතාවන් කර්මය මතම ප්‍රභවය වන ඒවා බව දක්වා ඇත. එකී විවිධතාවන්ගෙන් යුක්ත පුද්ගලයකු විද්‍යමාන වන්නේ පෞද්ගලික හා සමාජයීය වශයෙන් බලපවත්වන සාධක රාශියක එකතුවක් වශයෙනි.

උච්ඡේදවාදයක් ඉදිරිපත් කළ ශාස්තෘවරයකු ලෙස අජිත කේසකම්බල සැලකේ. ඒ. එල්. බෂාම් මහතා ඔහුගේ දර්ශනය ලෝකායතවාදය ලෙස හඳුන්වා දෙයි.[74] (Materiatism) මනුෂ්‍යයා චතුර් මහා භූතයන්ගේ නිර්මිතයකි.

JOURNAL OF THE FACULTY OF HUMANITIES -31

---

[71] සබ්බවාරි වාරිතෝ ච හොති, සබ්බවාරි යුතෝ ච හොති, සබ්බවාරි ධුතෝ ච හෝති, සබ්බවාරි ඵුටෝ ච හෝති. දී. නි - සාමඤ්ඤඵල සූත්‍රය, 100 පිටුව.

[72] ප්‍රාණඝාත විරමණය. මුසාවාද විරමණය. අදින්නාදාන විරමණය. අබ්‍රහ්මචරිය විරමණය. සර්ව විරමණය, -එම

[73] දී.නි I, සාමඤ්ඤඵල සූත්‍රය, 98 පිටුව.

[74] බෂාම්, ඒ. එල්., *අසිරිමත් ඉන්දියාව.* කොළඹ. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. 378 පිටුව.

ඔහු මැරුණු කල පෘථිවි ධාතුව පෘථිවි ධාතු කාය හා එක්වෙයි. ආපෝ ධාතුව ආපෝ ධාතු කායට ද තේජෝ ධාතුව තේජෝ ධාතු කායට ද වායෝ ධාතුව වායෝ ධාතු කායට ද එක් වෙයි[75]. බුදු දහමට අනුව යමෙක් දන් දෙයි ද එහි විපාක ඇත. ගුණවතුන්ට පුද පඬුරු දීමෙහි විපාක ඇත. මවට සැලකීම පියාට සැලකීම මෙලොව පරලොව පිළිගැනීම ආදියෙහි විපාක ඇත. අජිත ඒවා ප්‍රතික්ෂේප කළේය. ඔහු ඊට ප්‍රතිරුද්ධ අංශය පිළිගත්තේය. එනිසා බුදුරජාණන් වහන්සේ ඔහු දස වස්තුක මිථ්‍යා දෘෂ්ටිකයකු ලෙස හඳුන්වා දී තිබේ.[76] අජිත කේසකම්බලගේ දර්ශනයට අනුව යහපත් වූ හෝ අයහපත් වූ හෝ පුද්ගල විවිධත්වයකින් ප්‍රයෝජනයක් නැත. මන්ද සියල්ල මරණයත් සමග අවසන් වන නිසාය.

පකුධ කච්චායන සප්ත කායවාදයක් ඉදිරිපත් කරමින් පුද්ගලයා හා විවිධත්වය පිළිබඳ අදහස් දැක්වීය. ඔහුගේ දර්ශනයට අනුව පුද්ගලයා නිර්මාණය වී තිබෙන්නේ පඨවි, ආපෝ, තෙජෝ, වායෝ, සුඛ, දුක්ඛ හා ජීව යන ස්ථිර වූ කොටස් හතෙහි එකතුවෙනි.[77] ඔහුගේ සත්පදාර්ථ නියමය මත කෙනෙකු ඝාතනය කිරීම වරදක් ලෙස නොදකී, "යමෙකු තියුණු ආයුධයකින් හිස සිඳින්නේ නම් එහිලා කිසිවෙක් කිසිවෙකු ඝාතනය නො කරන්නේය. සිදු වන්නේ සප්තකායයන් අතරින් ආයුධයක් ගමන් කිරීම පමණි."[78] මොහුගේ දර්ශනය තුළ පිං පව් ආදි වශයෙන් සදාචාරාත්මක ඇගයීමක් ද දක්නට නො ලැබේ. මෙම භෞතිකවාදී චින්තනය අනුව ධනාත්මක හෝ ඍණාත්මක පුද්ගල විවිධත්වයක් විද්‍යමාන නො වේ. කච්චායනගේ සප්ත කායවාදය පුද්ගලයා තුළ සමාජ විරෝධී විවිධතාවන් ඇති කරවන්නක් ලෙස ද සැලකිය හැකිය.

භාරතීය ඉතිහාසයෙහි පැරණිතම ආගමික සම්ප්‍රදායයක් වශයෙන් සැලකෙන හින්දු ආගමෙහි පුද්ගලයා හා පුද්ගල විවිධත්වය පිළිබඳ එන විග්‍රහයන්හි දැකගත හැකි ප්‍රමුඛත ම ලක්ෂණය වන්නේ සියුම් කර්ම සංකල්පයක් මත ඒවා පදනම් වී තිබීම යි. පුද්ගල වෛමත්තතාව පිළිබඳ හින්දු දහමේ ස්ථාවරය හඳුනා ගැනීමේ දී එල්.එම් බෂාම් මහතා කරන විවරණය වැදගත් කොට සැලකිය හැකි ය. ''හින්දු විග්‍රහය අනුව කර්මය යනු කළ දේය. හෙවත් අතීතයේ දී කළ දෑ අපට නොපෙනී මුහුකුරා යාම යි. දේව, මනුෂ්‍ය, සත්ව, ආත්ම වශයෙන් හෝ අපායවල හෝ යමෙකු මතු ජාතියේ දී ලබන ශරීරය කර්මය අනුව ලබන්නකි. මිනිසකුගේ චරිතය, වාසනාව, කුලය සැප-දුක යන සියල්ල රඳා පවතින්නේ කර්මය මතය. යමෙකු කළ යහපත් ක්‍රියාවන් කවදා හෝ සැපක් වශයෙන් ඵලදෙයි. එසේම අයහපත් ක්‍රියාවෙන් දුකක් වශයෙන් ඵලදෙයි.[79] මේ අනුව හින්දු දර්ශනයෙන් අවධාරණය කෙරෙන්නේ මිනිසා තුළ නිර්මාණය වන සියලු වෛමත්තතාවන් කර්ම ශක්තිය මත සිදුවන බවයි.

පසුකාලීනව බිහි වූ දේවවාදී ආගම්වල ද පුද්ගලත්වය හා විවිධත්වය පිළිබඳ සාකච්ඡා වී තිබේ. ඒ අතරින් පැරණි ඉරාණය හෙවත් පර්සියාවේ ව්‍යාප්ත වූ දහමක් ලෙස සරථුස්ත්‍ර ධර්මය හෙවත් මස්දා ධර්මය සැලකේ.

[75] දී.නි I, සාමඤ්ඤඵල සූත්‍රය, 99 පිටුව.
[76] ම.නි I, මහාචත්තාරීසක සූත්‍රය
[77] දි.නි I, සාමඤ්ඤඵල සූත්‍රය, 99 පිටුව.
[78] ''...තිණ්හේන සත්ථෙන සීසං ඡන්දති. න කොචි කිඤ්චි ජීවිතා වොරොපෙති. සත්තන්නං යෙව කායානමන්තරේ සත්ථං විවරමනුපේතීති - එම.
[79] බෂාම්, එල්.එම්., (1995). අසිරිමත් ඉන්දියාව. කොළඹ. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. 410 පිටුව.

JOURNAL OF THE FACULTY OF HUMANITIES-31

එම ආගමික භක්තිකයන් විශ්වාස කරන අන්දමට මෙහි සමාරම්භකයා ලෙස සැලකෙන්නේ ක්‍රි.ව 1000 දී පමණ විසූ සරටුස්ත්‍රතුමාය.[80] එතුමා දේවධර්මීය ආගමක් දේශනා කළේය. මස්දා ධර්මයෙහි ශුද්ධ වූ ආගමික මූලාශ්‍රය ලෙස සැලකෙන්නේ අවෙස්ථාවයි.

සරටුස්ත්‍රාගමෙහි මිනිසා පිළිබඳ ඉදිරිපත් වන්නේ දේව නිර්මාණාත්මක අදහසකි. අහුරමස්දා නම් සරටුස්ත්‍රාගමෙහි එක ම දෙවිඳුන්ය. ඔහු සදාතනික ජීවනයේ සහ ප්‍රඥාවේ දෙවියා (The lord of Eternal life and wisdom) ලෙසින් හැඳින්වේ. අහුරමස්දා විසින් විශ්වය නිර්මාණය කිරීමේදී එහි ඉතා වැදගත්ම නිර්මාණය වශයෙන් පූර්ණ මිනිසෙකු මවන ලද බව පැවසේ. එසේ මවන ලද මිනිසාගේ අංශ කිහිපයකි. එනම්

1. ආත්මය (self)
2. භෞතික ශරීරය (physical Body)
3. ප්‍රාණය (vital Energy)[81]

වශයෙනි. මෙසේ කොටස් කිහිපයක සංකලනයෙන් අහුරමස්දා දෙවිඳුන් විසින් මවන ලද මිනිසා විවිධතාවන්ගෙන් යුක්ත වන්නේ ස්පෙන්ටා මෛන්‍යු (Spenta Mainyn) සහ අංග්‍ර මෛන්‍යු (Angra Mainyn) යන දෙදෙනාගේ සම්බන්ධය හේතු කොටගෙනය.[82] ඔවුන් අහුරමස්දා දෙවිඳුන්ගේ නිවුන් දරුවන් දෙදෙනෙකි. ස්පෙන්ටා මෛන්‍යු ලෝකයෙහි සත්‍ය, ධර්මය, යුක්තිය වැනි යහපත් ගුණාංගයන් වර්ධනය කිරීමට උත්සාහ දරන අතර ඔහුගේ ප්‍රතිවාදියා වූ අංග්‍ර මෛන්‍යු හෙවත් අහිරිමාන් පාපය, අසත්‍ය, දුරාචාරය ආදි වූ සාපරාධී චර්යා වර්ධනය කිරීමට යත්න දරයි.[83]

මිනිසා අහුරමස්දා දෙවිඳුන්ගේ නිර්මාණයක් වන නිසා ඔහුට උපතේදී ම ස්වච්ඡන්දතාව හෙවත් තෝරා ගැනීමේ අවස්ථාව සලසා ඇත. ඒ අනුව යහපත හෙවත් හොඳ තෝරා ගෙන එය ප්‍රගුණ කොට පරම විමුක්තිය උදාකර ගැනීම හෝ නරක හෙවත් පාපය තෝරා ගෙන මරණින් මතු නිරාගත වෙනවාද යන්න පුද්ගලයා විසින් ම තීරණය කළ යුතුය.[84] සරටුස්ත්‍රාගමෙන් පුද්ගල විවිධත්වය ප්‍රකටවන ප්‍රධාන පුද්ගල ප්‍රභේද දෙකකි. එනම්

1. ආශවන් -ධාර්මික මිනිසා (righteous man)
2. අනාශවන් - අධාර්මික මිනිසා (unrighteous man)

යනුවෙනි. දැහැමි සිතිවිලි, දැහැමි වදන්, සහ දැහැමි ක්‍රියා ප්‍රගුණ කරන්නා ධාර්මික පුද්ගලයා හෙවත් ආශවන් යනුවෙන් හඳුන්වනු ලැබේ. අනාශවන් (අධාර්මික මිනිසා) යනු පාපී සිතුවිලි, පාපී ක්‍රියා සහ පාපී වදන්වලින් තම ආධ්‍යාත්මය කෙලෙසා ගන්නාය. මෙයට අමතරව ධාර්මික මිනිසා හෙවත් ආශවන් ළඟ ආත්මීය පාරිශුද්ධතාව, අවංක බව, පරිත්‍යාගය, කාරුණිකත්වය හා දානපතිත්වය ආදී ගුණාංග ද අධාර්මික මිනිසා තුළ බොරු කීම,

---

[80] ධම්මදස්සි හිමි, නායිම්බල., (2004). *දේවධර්මවාදී ආගම්.* 01 පිටුව.
[81] අවෙස්තාව, යස්න, 13 - 61.
[82] අවෙස්තාව, යස්න, 30, 3 - 6.
[83] ධම්මදස්සි හිමි නායිම්බල., (2004). *දේවධර්මවාදී ආගම්.* 01 පිටුව.
[84] එම, 22 පිටුව.

JOURNAL OF THE FACULTY OF HUMANITIES -31

වංචනිකත්වය, ප්‍රායෝකාරීත්වය, ණයගැති බව, සොරමැරකම්, කාමුකත්වය, සල්ලාල බව, ස්ත්‍රී දූෂණය හා ගබ්සා කිරීම ආදිය ඇතුලත්ව තිබේ[85]. මේ අනුව සරථුස්ත්‍රාගමෙන් අවධාරණය කරන්නේ මානව සමාජය වෙමත්තතාවන්ගෙන් ගහන මිනිසුන් වෙසෙන තැනක් බවයි.

දේවවාදි ආගම් අතර යුදෙව්, ක්‍රිස්තියානි හා ඉස්ලාම් යන ආගම් සෙමිටික් පවුලට අයත් වන ආගමය. සෙමිටික් යනුවෙන් අදහස් වන්නේ ආදම් නම් මුල් ම මිනිසාගෙන් පැවත එන මිනිස් පරපුරේ දස වැන්නාට අයත් නෝවා (Nova) ගේ පුත් ෂේම් (Shem) ගේ නාමයෙන් පැවතගෙන එන යන අර්ථය යි.[86] සෙමිටික් පවුලට අයත් ආගම් අතර පළමු වැන්න යුදෙව් දහමයි. එය හීබ්‍රෑ දහම ලෙස ද සැලකේ. යුදෙව් දහමෙහි ආගමික ශුද්ධ මූලාශ්‍රය වන්නේ බයිබලයේ පැරණි තෙස්තමේන්තුවයි. එහි සඳහන් තොරතුරුවලට අනුව යාවේ නම් වූ එකම දෙවියන් වහන්සේ මිනිසා ඇතුළු සියල්ල මැවූ බව කියවේ. පටන් ගැනීමේ දී දෙවියන් වහන්සේ අහසත් පොළොවත් මැවූ සේක.[87] මවන ලද විශ්වයෙහි සත්ත්ව වර්ගයා මැවීමේ ගෞරවය හිමි වන්නේ ද ඔහුටය.''දෙවි සමිදාණන් වහන්සේ පොළොවෙහි දූවිල්ලෙන් මිනිසා මවා ඔහුගේ නාස්පුඩු තුළට ජීවන හුස්ම හෙලූ සේක. මෙසේ මනුෂ්‍යයා ජීවමාන කෙනෙක් විය.''[88]

මෙමගින් මිනිසා සහ පොළොව අතර අවියෝජනීය සම්බන්ධතාවක් ඉස්මතු කර ඇත. මිනිසාගේ සිරුර අස්ථිර විනාශ වන සුලු තාවකාලික වූවක් බව හඟවයි. මිනිස් සිරුර තුළ පවත්නා සජීවී බව දිව්‍යමය වූවකි. ඒ අනුව මිනිස් සිරුර තුළ පවත්නා ආත්මය අනෙකක් නොව දෙවියන් වහන්සේ විසින් මිනිස් සිරුරට හෙලූ ජීවන හුස්මයි. දෙවියන් වහන්සේ විසින් මවන ලද මිනිසා තුළ ප්‍රථම වතාවට විවිධතාවක් ප්‍රකට වන්නේ ස්ත්‍රී-පුරුෂ වශයෙනි. එයද දෙවියන් විසින් ම නිර්මිත විවිධත්වයකි.

> ''එවිට දෙවි සමිදාණන් වහන්සේ මිනිසා බර නින්දකට පත්කළ සේක. ඔහු නිදා සිටියදී උන්වහන්සේ ඔහුගේ ඇට වලින් එකක් ගෙන ඒ ස්ථානය වසා දමූ සේක. උන්වහන්සේ ඔහුගෙන් ගත් ඉල ඇටයෙන් ස්ත්‍රියක මවා ඔහු වෙත ගෙනා සේක.[89]

යුදෙව් දහමෙහි එන දසපනතෙන් ද පැහැදිලි වන්නේ තත්කාලීන සමාජයෙහි විසූ මිනිසුන්ගේ ඍණාත්මක විවිධත්වයන් බැහැරලීමට එකී ආගමික සංස්ථාව විසින් අවශ්‍ය පියවර ගැනීමකි. එම දස පනත නික්ම යෑමෙහි සඳහන් වන්නේ

1. මා හැර වෙනත් දෙවිවරුන් සරණ නොයන්න.
2. මට සමාන දෙයක් (ප්‍රතිරූපයක්) සාදා නොගන්න. ඊට නමස්කාර නොකරන්න. ඊට සේවය නොකරන්න.
3. ඔබගේ දෙවි වූ ස්වාමීන් වහන්සේගේ නාමය බොරුවට ව්‍යවහාර නොකරන්න.
4. සබත් දවස් ශුද්ධ ලෙස පවත්වන්නට සිහිතබා ගන්න.
5. ඔබගේ පියාටත්, මවටත් ගෞරව කරන්න.

[85] එම, 23 පිටුව.
[86] එම, 25 පිටුව.
[87] උත්, 1 - 11, ශුද්ධ බයිබලය., 1958, පැරණි තේස්තමේන්තුව, ශ්‍රී ලංකා බයිබල් සමාගම,
[88] උත්, 18 - 27, එම.
[89] උත්, 2, 21- 25, එම.

6. මිනී නොමරන්න.
7. කාම ‍ෘාචාරය නොකරන්න.
8. සොරකම් නොකරන්න.
9. අසල්වැසියාට විරුද්ධව බොරු සාක්ෂි නොකියන්න.
10. අසල්වැසියාගේ ගෙට ආසා නොවන්න. බිරිඳට, වැඩකරුවාට, ගවයාට, කොටළුවාට හෝ අසල්වැසියාගේ කිසි දේකට ආසා නොකරන්න.[90]

විසිවන සියවස දේවවාදී ආගම්වලට අභියෝගාත්මක කාලපරිච්ඡේදයක් විය. මන්ද ස්වාභාවික විද්‍යාවන්ගේ නැගීමයි. එමගින් මිනිසාගේ ආරම්භය හා වෙනස්කම් දෙවියන් වහන්සේගේ මැවීමේ ප්‍රතිඵලයක් ලෙස සැලකීම අනාදිමත් කලක පටන් පැරණි යුරෝපීය සමාජයේ තිබූ විශ්වාසයයි. එතෙක් පැවැති එම දේවනිර්මාණවාදය නව පර්යේෂණයන්ගේ අනාවරණයනුත් සමග වෙනස් විය.[91]

යුදෙව් දසපනත දේව හෙළිදරව්වක් ලෙස සැලකුණ ද ඒ දෙස විමර්ශනාත්මකව බැලීමේ දී මානව සමාජයේ පුද්ගලයන් තුළ පවත්නා දුරාචාරි විවිධත්වයන් දුරුකොට යහපත් ගුණ ධර්ම ප්‍රගුණ කිරිමෙහි ලා එකී ආගමික සම්ප්‍රදායෙහි ආරම්භයේ දී විසූ පූජකයෙකු විසින් සකස් කරන ලද්දක් බව පෙනේ. දස පනත තුළින් පුද්ගල විවිධත්වයේ ස්වරූපය යුදෙව් දහමට අනුව විවරණය වේ. ඒ තුළ ආගමික, සාමාජික වශයෙන් පුද්ගලයන් තුළ පවත්නා විවිධතාවන් ප්‍රකට කරයි. මුල් පනත් සතර ම ආගමික වශයෙන් පුද්ගල විවිධත්වය පැහැදිලි කරයි. අනෙක් පනත් සයෙන් ම පැහැදිලි වන්නේ සාමාජික වශයෙන් පුද්ගලයන් තුළ පවත්නා විවිධතාවය යි. දෙමාපියන්ට ගෞරව කරන සහ නො කරන පුද්ගලයන් ද අන් අයගේ ජීවිත විනාශ කරන පුද්ගලයන් මෙන් ම අන්සතු ජීවිත රකින්නන්ද, කාම මිථ්‍යාචාරයෙහි යෙදෙන්නන් සහ නොයෙදෙන්නන් ද තම අසල්වැසියන්ට විරුද්ධවාදීව කටයුතු කරන්නන් මෙන් ම එසේ නොකරන්නන් ද, අන්සතු වස්තුවට, දේපළවලට ආශා කරන්නන් සහ එසේ නොකරන්නන් ද තත්කාලීන සමාජයේ සිටි බව දස පනතෙන් විද්‍යමාන වේ. යුදෙව් මතය අනුව දෙවියන් වහන්සේ මිනිසා මවා ඇත්තේ නිදහස් සත්වයෙකු ලෙසය. දෙවියන් වහන්සේටත් එතුමාගේ ආඥා පද්ධතියටත් අවනතව ක්‍රියා කිරිම හෝ එසේ නො කිරීම යන විකල්ප දෙකින් එකක් තෝරා ගැනීමේ අවස්ථාව පුද්ගලයාට හිමි වී ඇත. මෙමගින් පැහැදිලි වන්නේ දේව නිර්මාණයේ ප්‍රාරම්භක අවස්ථාවේදී ම දෙවියන් විසින් විවිධත්වය ද ප්‍රදානය කළ බව යි.

සෙමිටික් පවුලට අයත් තවත් ආගමක් වන්නේ කිතුනු දහමයි. ඔවුන්ගේ ධර්ම සාහිත්‍යය වන්නේ බයිබලයේ අලුත් ගිවිසුම යි. එහි නිර්මාතෘවරයා ජේසුතුමාය. කිතුනුවන්ගේ පිළිගැනීම අනුව ස්වකීය දෙවියන් වහන්සේ යුදෙව් දහමේ මෙන් එම ජාතියට පමණක් කරුණාව දයාව දක්වන දෙවි කෙනෙකු නො වේ. ඔහු සමස්ත මනුෂ්‍ය වර්ගයාට ම කරුණාව දක්වන දෙවියන් වහන්සේ කෙනෙකි.

ලෝකය හා සත්වයා නිර්මාණය කිරීම පිළිබඳ පරණ තෙස්තමේන්තුවේ එන අදහස ඔවුන් ද එලෙසින් ම පිළිගන්නා බව පෙනේ. මනුෂ්‍යයා ලෙසින් සැලකෙන්නේ දෙවියන් වහන්සේගේ ලෝක නිර්මාණ ක්‍රියාවලියෙහි පරිසමාප්තය

[90] මූර්ති., (2009). *ආගම හා මියගිය ලෝකය.* මයූර ප්‍රකාශකයෝ. 177 පිටුව.
[91] අමරසේකර දයා., (1999). *සමාජ මානව විද්‍යාව.* 11 පිටුව.

මෙන් ම අග්‍රඵලය ද වේ. එය දෙවියන් වහන්සේගේ ශ්‍රේෂ්ඨතම නිර්මාණයයි.[92] තවද ඔහුට සෙසු සත්වයින්ට වඩා බුද්ධිය සංවේදී බව සමග ලොව ඇති සියල්ලෙහි උරුමය ද හිමිකර දී ඇත. මෙසේ දෙවියන් වහන්සේ විසින් මවන ලද මිනිසාගේ ද්වෛතවාදයක් දක්නට ලැබේ. එනම්

1. භෞතික ශරීරය
2. ආත්මීය ශරීරය[93]

එයින් භෞතික සිරුර විනාශයට හෙවත් අනිත්‍යත්වයට පත්වන අතර, ආත්මීය සිරුර සදාතනිකත්වය හා බැඳේ. හෙවත් එය දෙවියන් වහන්සේ හා සම්බන්ධ වේ. එසේම යුදෙව් දහමේ මෙන් ම දෙවියන් වහන්සේ විසින් පුද්ගලයාට තෝරා ගැනීමේ අයිතිය ලබාදී තිබෙන හොඳ නරක අනුව ද පුද්ගල විවිධත්වය නිර්මාණය වේ. කිතුනු දහමට අනුව දෙවියන් වහන්සේගේ ආඥා සුරකිමින් හොඳ ප්‍රගුණ කිරිම හෝ දෙවියන් වහන්සේගේ ආඥා උල්ලංඝනය කරමින් නරක ප්‍රගුණ කිරීම යන මාර්ග දෙකෙන් එකක් තෝරා කටයුතු කිරීමේ නිදහස ඇත. ඒ අනුව කිතුනු දහම අවධාරණය කරන්නේ දෙවියන් විසින් ම මවන ලද මනුෂ්‍ය සත්වයා විවිධත්වයෙන් යුක්ත වීමේ හේතුවත් අවසාන වශයෙන් මරණයට පත්වීමේ හේතුවත් දෙවියන්ගේ අණ කඩ කිරීම්බවයි.

භාරතීය ආගම්වල (ජෛන-බෞද්ධ-උපනිශද්) මෙන් කර්මය වැනි සාධක පුද්ගල විවිධත්වය සඳහා හේතු නොවන බව කිතුනු ආගමික මතයයි. මිනිසාට ඇත්තේ එකම උපතක් බවත් එය දෙවියන් විසින් ලබාදෙන උපතක් බවත් කිතුනුවෝ විශ්වාස කරති. මෙසේ උපත ලබන මිනිසුන් අතුරින් කෙනෙක් උපතින් ම අඳ-ගොළු-බිහිරි හා වෙනත් දහසකුත් එකක් කායික මානසික රෝග පීඩාවලට ගොදුරු වී දුක්විඳින අතර තවත් පිරිසක් නිරෝගීමත්ව, භාග්‍යවන්තව සහ ධනවත්ව ඉපිද අනන්ත සැප විඳිනු දැකිය හැකි ය. කිතුනු දහම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක යෙදුනු ආචාර්ය නායිම්බල ධම්මදස්සි හිමියන් ප්‍රකාශ කර සිටින්නේ දෙවියන් වහන්සේ සර්වතෝ භද්‍ර හා සර්ව සාධාරණ කෙනෙක් වන්නේ නම් උපතට පෙර කිසිදු වරදක්-පාපී අකුසල කර්මයක් කර නැති එසේ ම දෙවියන් වහන්සේ වෙතින් ම එකම හා පළමු උපත ලබා ඇති මිනිසුන් අතරින් මෙවැනි විවිධතා විද්‍යමාන වන්නේ කෙසේද යනුවෙනි.[94] උන්වහන්සේ ඒ සඳහා තදීය මූලාශ්‍රයන්හි එන පිළිතුරු කිහිපයක් මෙසේ ඉදිරිපත් කරති.

- මිනිසා පරිපූර්ණ සත්වයෙකු නොවන නිසා විවිධතා ඉස්මතු විය හැකි බව.
- දෙවියන් වහන්සේගේ බලය හා ආනුභාවය ප්‍රකට කිරීමේ මාධ්‍යයක් ලෙස සිදුවිය හැකි බව.
- ශෝධක ධර්මයක් ලෙස සිදුවිය හැකි බව.
- නීතියක් වරප්‍රසාදයක් ශික්ෂණ ධර්මයක් ලෙස පිළිගත යුතු බව[95]

[92] නානායක්කාර, සනත්., *බුදුදහම සහ ශ්‍රී ලංකාවේ සෙසු ආගම්.* 61 පිටුව.
[93] ධම්මදස්සි හිමි, නායිම්බල., *දේව ධර්මවාදී ආගම්.* 70 පිටුව.
[94] එම, 76 පිටුව.
[95] - එම.

දේවයන්ගේ විනිශ්චය යටතේ පුද්ගල විවිධත්වය නිර්මාණය වන ආකාරය පිළිබඳ බටහිර විද්වතෙකු වූ Gladys Brayson ගේ අදහස මෙසේය.''සමාජය යනු දෙවියන්ගේ උද්‍යානයයි. එහි හොඳ සහ නරකින් යුත් ප්‍රඥාවේ ගස සිටුවා තිබේ. එහි ඵල අනුභව කිරීමට පෙර ඒවා වෙන්කර හඳුනාගන්නට මිනිසා යොමුකරනු ලැබේ.''[96] ඉහත සාධක මත කිතුනු දහමේ පුද්ගලයා හා විවිධත්වය දේවකේන්ද්‍රීයව විවරණය වී ඇති බව පැහැදිලිය.

මොහම්මද් නබි නායකතුමන්ගේ ආදී කතෘත්වයෙන් ක්‍රිස්තු වර්ෂ හයවැනි සියවසේ අගභාගයේ දි පමණ ආරම්භ වූ ඉස්ලාම් ධර්මය සෙමිටික් පවුලට අයත් ආගම් අතර ලාබාලතම ආගමයි. ඉස්ලාම් දහම අරාබිකරයේ ප්‍රභවය වී ව්‍යාප්ත වූ දහමකි.

ඉස්ලාම් ධර්මය ද පුද්ගලයා සහ විවිධත්වය පිළිබඳ දක්වන්නේ නිර්මාණවාදී ආකල්පයකි. අල්ලාහ් නම් එකම දෙවියන් විසින් සිදු කරන ලද නිර්මාණ කාර්යයෙහි අවසන් ප්‍රතිඵලය ලෙස දූවිල්ලෙන් (dust) සහ ලේ කැටිවලින් (clots of blood) මිනිසා මැවූ බව ඉස්ලාම් දහමෙහි පිළිගත් මතය යි. එහි දි ස්ත්‍රී පුරුෂ භේදය ද අල්ලාහ් විසින් ම කරන ලදි.

"අපි මිනිසා කිරිමැටියෙහි (වූ) සාරයෙන් නිර්මාණය කළෙම්දූම ය. පැසුළු අපි කලලය ලෙස ස්ථාවර අංශයෙක්හි කළෙමු. පැසුළු අපි කලලය ඝන ලේ කැටියක් කළෙමු. පැසුළු මාංශ පිණ්ඩයක් කළෙමු... ඉතා ලක්ෂණ නිර්මාපකයා වූ අල්ලාහ් අති ශ්‍රේෂ්ඨය."[97] මෙලෙස දෙවියන් වහන්සේ ස්මෘතිය, ඥානය හා අවබෝධය ආදි ගුණාංගයන්ගෙන් හෙබි විශ්වාසවන්තයා ලෙස මිනිසා නිමවූ බව කුරාණය පවසයි.

ඉස්ලාම් දහම විවිධත්වයේ ඒකත්වය (Unity in devesrity) විද්‍යමාන කරන සහ ප්‍රායෝගිකකරණය කරන දහමකි. මෙහි විවිධත්වයේ ඒකත්වය යන්න එක්තරා විශේෂිත අර්ථයකින් දක්වා තිබේ. එනම් අල්ලාහ් දෙවියන් එකම සහ පරම දෙවියන් ලෙස අවිවාදයෙන් පිළිගන්නා වූ ද, ඉස්ලාම් ධර්මාගත මූලධර්ම පද්ධතිය භක්තිමත්ව විශ්වාස කරන්නා වූ ද, පිළිපදින්නා වූ ද සියල්ලෝම දේශ - කාල - පුද්ගල - ජාති - ගෝත්‍ර - වර්ණ ආදී සියලු විවිධතා සීමා පරස්පරතා සංඥා ඉක්මවා ඒකාත්මික වූ විශ්වීය සහෝදරත්වයකින් (Univesal brotherhood) බැඳී සිටී යන්න ය.[98] පුද්ගලාන්තර විවිධත්වය පිළිබඳ අනෙක් විශේෂිත කරුණ වන්නේ ධනවත් - දුප්පත්, උස් -පහත්, ස්වාමි - සේවක, රදළ - වහල්, ස්ත්‍රී පුරුෂ ආදි සකලවිධ භේදයෝ ද නො සැලකිය යුතු බවත් සියල්ලන්ට ම සම අයිතිවාසිකම්, අවස්ථා හිමි විය යුතු බවත් ය.[99]

[96] Socity…. may be considered as the garden of God, in which men tree of knowledge of good and evil is planted; and in which men are destined to distingnish, and to chuse, among it's fruits Bryson, Glodys, 1945, Man and Society, New york

[97] සුරත් 23, 12, 14, 96-2 *ශුද්ධ අල්කුරාණය,* 1961, ශ්‍රී ලංකා ජමාත්, ඒ ඉස්ලාම්.

[98] සුරත්, 2, 19 - 23, 52 - 54, 21,92 -93, 49, 13 -එම.

[99] ධම්මදස්සි හිමි, නායිම්බල., *දේව ධර්මවාදී ආගම්.* 86 පිටුව.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 31

මේ අනුව අල්ලාහ් දෙවියන් විසින් මවන ලද මිනිසා තුළ පෞද්ගලික සහ පොදු වශයෙන් පවත්නා විවිධත්වයේ ඒකත්වය සපථ කෙරෙන අයුරින් කරුණු දක්වා ඇති බව පැහැදිලිය.

පුද්ගලානුබද්ධව විද්‍යමාන වන තවත් විවිධත්වයකි දුක-සැප. ඉස්ලාම් දහමෙහි ද මෙම විවිධත්වය පිළිබඳව අදහස් ගැබ් ව තිබේ. දුක-සැප ජීවිතයේ නොයෙක් අවස්ථාවල දී ඒ මේ අත දෝලනය වෙමින් පවතිනුයේ කෙසේද? එසේ වීමට හේතුව කුමක්ද? කෙනෙක් උපතේදී ම ආබාධිතව, රෝගීව, දුක්ඛිතව බිහිවන අතර තවත් කෙනෙකු උපතේදී ම වාසනාව-සෞභාග්‍ය, නිරෝගීබව උරුමකොට ගෙන බිහි වන්නේ ඇයි? සියලු දුසිරිත් හි ඇළුණු ඇතැම් පාපී මිනිසුන්ට උපදින දරුවන් නිරෝගීව සුරූපීව ආබාධ රහිතව උපදින අතර තවත් විටක දැහැමි සත්පුරුෂ ගුණගරුක අයට උපදින දරුවන් රෝගී විරූපී වන්නේ ඇයි? යනුවෙන් පැන නගින ගැටලු විෂයෙහි ලෝකයේ බොහෝ ආගම්වල යම් යම් නිර්ණායකයන් ඉදිරිපත් වී අත.[100] ඉස්ලාම් දහමෙහි ඉහත විවිධතාවන් විෂයෙහි ප්‍රමුඛ සාධකය වන්නේ අල්ලාහ් දෙවියන්ගේ බලයයි.

5. නිගමනය

පුද්ගලයා, ඔහුගේ විවිධත්වය හා ප්‍රකට ආගමික සංස්ථාවන් පිළිබඳ මෙතෙක් සාකච්ඡා කරන ලද තොරතුරුවලට අනුව හෙළිදරව් වන්නේ දේවවාදී ආගම්වල එය දෙවියන් වහන්සේගේ පුද්ගල නිර්මාණ කාර්යය හා බැඳී පවතින්නක් බවයි. උපතත් මරණයත් අතර කාලය මිනිසාට ස්වකීය කැමැත්තට අනුව ක්‍රියාත්මක විය හැකි වුව ද එහිදී ඇති වන පුද්ගල විවිධතාවන්හි විනිශ්චය දෙවියන් වහන්සේ සතුය. විවිධත්වයේ ඒකත්වය ද විවිධත්වයේ සමෝධානය ද දේව අධිකාරිමය බලයට යටත්ව විග්‍රහ වී ඇති බව නිගමනය කළ හැකිය. නමුත් කිසිදු ආගමික මතවාදයක එල්බ නොගෙන නිදහස් කල්පනාවෙන් විමසා බැලීමේ දී මානව ජීවිතය හා සබැඳෙන විශ්වමය වූ ස්වාභාවික සිද්ධාන්තයක් පවත්නා බව අවබෝධ කොට ගැනීම එතරම් අපහසු නොවේ.

[100] එම.

JOURNAL OF THE FACULTY OF HUMANITIES

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අංගුත්තර නිකාය., (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. දෙහිවල. පුනර් මුද්‍රණය.

ඛුද්දක නිකාය., (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. දෙහිවල. පුනර් මුද්‍රණය.

දීඝ නිකාය., (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. දෙහිවල. පුනර් මුද්‍රණය.

පුග්ගල පඤ්ඤත්තිප්ප්‍රකරණ. (2005). *අභිධර්මපිටකය.* දෙහිවල. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

මජ්ඣිම නිකාය., (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. දෙහිවල. පුනර් මුද්‍රණය.

විනය පිටකය., (2005). බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. දෙහිවල. පුනර් මුද්‍රණය.

සංයුක්ත නිකාය., (2006). බණ්ඩාරගම. ශ්‍රී ලංකා ධර්මචක්‍ර ළමා පදනම.

අමරසේකර, දයා., (1999). *සමාජ මානව විද්‍යාව.* වරකාපොල. ආරිය ප්‍රකාශකයෝ.

අරියවිමල හිමි, කොස්වත්තේ., (1996). *බුද්ධ ධර්මය.* කොළඹ 10. සමයවර්ධන ප්‍රකාශකයෝ.

අමරසිරිතිස්ස, හිමි, කටුවැල්ලේගම., (2000). *විශ්වය විද්‍යාව හා බුදුදහම.* කොළඹ 10. සමයවර්ධන ප්‍රකාශකයෝ.

එදිරිසිංහ දයා, ප්‍රියදර්ශන වසන්ත, ඉලංගකෝන් සමන්ත., (2008). *බෞද්ධ දර්ශනය හා භාරතීය ශ්‍රමණ සම්ප්‍රදාය.* දෙහිවල. වත්මා ප්‍රකාශකයෝ.

ගල්මංගොඩ, සුමනපාල., (2006). *බෞද්ධ භාවනා ක්‍රම හා මනෝ චිකිත්සාව.* දිවුලපිටිය. සරස්වතී ප්‍රකාශකයෝ.

ගමගේ, එස්. අයි., (2003). *බෞද්ධ ශිෂ්ටාචාරය.* කොළඹ. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ගුණතිලක, එච්. එම්., (2002). *බුදුදහම 21වන සියවසට.* දෙහිවල. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ගුණසේකර, දයා., (2009). *මජ්ඣිම නිකාය අටුවාව (පරි).* පපඤ්ච සූදනී, තුන්වැනි භාගය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ජයසිංහ, ඒ.කේ.ජී., (2005). *සමාජ ස්ථාරායනය.* මරදාන. ගොඩගේ සහ සහෝදරයෝ.

ජයසිංහ, ඒ.කේ.ජී., (2005). *සමාජ මානව විද්‍යාවෙ මූලධර්ම.* මරදාන. ගොඩගේ සහ සහෝදරයෝ.

ජයවර්ධන, ආර්.පී.ඩී., (1996). *නියාම ධර්ම විවරණය.* මහනුවර. බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය.

ඤාණෝභාසතිස්ස හිමි, මොරගොල්ලේ., (2005). *ධම්මපද විවරණය.* කොළඹ 11. ගුනසේන සහ සමාගම.

ඤාණසුමන හිමි, දෙල්දූවේ., *ආදී බෞද්ධ දර්ශනයේ මූලධර්ම.* කොළඹ 10. ගොඩගේ සහ සහෝදරයෝ.

නන්දන පෙරේරා, වී. පී., *ඉස්ලාම් ධර්මය හා සමාජ ක්‍රමය.* කොලඹ 10. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

නහල්ලේ, චාමලී., (2001). *මානව විවිධත්වය.* නුගේගොඩ. සමාජ විද්‍යා හා මානව අධ්‍යයනාංශය.

නානායක්කාර, සනත්., (2001). *බුදුදහම සහ ශ්‍රී ලංකාවේ සෙසු ආගම්.* බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය. දෙහිවල. පුනර් මුද්‍රණය.

ධම්මදස්සි හිමි, නායිම්බල., *දේවධර්මවාදී ආගම්.*

ධම්මපදට්ඨකථා., (2005). හේවාවිතාරණ සංස්කරණය, කොළඹ. ත්‍රිපිටක ග්‍රන්ථ මුද්‍රණාලය.

JOURNAL OF THE FACULTY OF HUMANITIES-31

නාරද හිමි, දියගම., (2009). *ෂට් ශාස්තෲන් සහ බුදුදහම.* කතෘ ප්‍රකාශක.

පඤ්ඤාලෝක හිමි, වැයිහේනේ., (1960). *වෛදික යුගයෙන් බෞද්ධ යුගයට.* කොළඹ. එම්. ඩී. ගුණසේන.

පේමසිරි හිමි, ආලංකුලමේ., (2009). *විශ්වය හා ජීවය පිළිබඳ බෞද්ධ සංකල්පය.* මාගධි. පුවක්පිටිය. පාලි හා බෞද්ධ අධ්‍යයන ආයතනය.

බෂාම්, ඒ. එල්., (1995). *අසිරිමත් ඉන්දියාව.* කොළඹ. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

බෞද්ධ ශිෂ්ටාචාරය., අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

බෞද්ධ විනය අධ්‍යයනය., ප්‍රධාන සංස්කාරක කොටපිටියේ රාහුල හිමි. කොට්ටේ කළ්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව. කොට්ටේ.

මූර්ති., (2009). *ආගම හා මියගිය ලෝකය.* මයුර ප්‍රකාශකයෝ.

මේධානන්ද හිමි, දේවාලේගම., (1997). බුදුදහම හා පරිසරය. කොළඹ. බුද්ධශාසන අමාත්‍යාංශය.

මෛත්‍රී මූර්ති හිමි, කරගොඩ උයන්ගොඩ., (2007). මනස පිළිබඳ බෞද්ධ විග්‍රහය. කොළඹ 10. සමයවර්ධන ප්‍රකාශකයෝ.

රත්නපාල, නන්දසේන., (2007). *සමාජ විද්‍යාවේ මූලධර්ම.* පන්නිපිටිය. ස්ටැම්ෆර්ඩ් ලේක්.

විශුද්ධි මාර්ගය., (1919). හේවාවිතාරණ සංස්කරණ, ත්‍රිපිටක ග්‍රන්ථ මුද්‍රණාලය.

විසුද්ධි මාර්ගය., (2006). හේවාවිතාරණ සංස්කරණය.

විවරණ, (2009). සාරස ප්‍රකාශන. (සංස්). මහමිතව පඤ්ඤාරතන හිමි, දියගම නාරදහිමි, රත්මල්වැටියේ සමිත හිමි.

වීරසේකර, ගුණපාල., (1968). *පාලි ශබ්දකෝෂය.* කොළඹ. ගුණසේන සහ සමාගම.

වීරරත්න, ඩබ්ලිව්. ජී., (1995). *බුදුදහම හා එහි ආගමික පසුබිම.* කොළඹ 12. ප්‍රදීප ප්‍රකාශකයෝ.

සමාජ විද්‍යාව., (2005). අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්මේන්තුව.

සමය අධ්‍යයනය., (2009). පාලි හා බෞද්ධ අධ්‍යයන ආයතනය. පුවක්පිටිය.

සද්ධම්මප්පජ්ජෝතිකා, *බුද්ධ ජයන්ති ග්‍රන්ථමාලා.* බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සිරිසුජාත හිමි, ලබුදූවේ., (2007). *ධම්ම ආරෝග්‍ය සහ මිනිසා.* පෙරාදෙණිය. ශ්‍රී ධර්ම ප්‍රකාශන.

සුමේද හිමි, මාහෝ., (1995). *ගිහි විනය හෙවත් සිඟාලෝවාද ධර්මය.* මහනුවර. බෞද්ධ ග්‍රන්ථ ප්‍රකාශන සමිතිය.

සෝභිත හිමි, බලංගොඩ., (1991). බුදුදහමින් පිළිබිඹු වන පෙළඹීම් නයාය. කොළඹ 10. ගොඩගේ සහ සහෝදරයෝ.

ශ්‍රී ධර්මකීර්ති හිමි, නිවන්දම., (2007). *විසුද්ධි මාර්ගය. (සිංහල).* දෙහිවල. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ශුද්ධ අල්කුරාණය., (1961). ශ්‍රී ලංකා ජමාත්. ඒ ඉස්ලාම්.

ශුද්ධ බයිබලය., (1958). පැරණි තෙස්තමේන්තුව. ශ්‍රී ලංකා බයිබල් සමාගම.

ශුද්ධ බයිබලය., (1958). නව තෙස්තමේන්තුව. ශ්‍රී ලංකා බයිබල් සමාගම.

හෙට්ටිආරච්චි, ධර්මසේන., *බෞද්ධ ආර්ථික දර්ශනය.* කොළඹ. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තු.

References

Bryson, Gladys., (1945). New york. Man and Society.

JOURNAL OF THE FACULTY OF HUMANITIES-31